සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

# 15 - ක්‍රිස්තියානි ධර්මය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතු ව ඇත.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

Download all Past Papers>  https://bookbeekid.com/resource/past-papers/

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

## 15 - ක්‍රිස්තියානි ධර්මය

## ලකුණු දීමේ පටිපාටිය

| | | |
|---|---|---|
| පළමු ප්‍රශ්න පත්‍රයට ලකුණු 1 x 40 | - | 40 |
| දෙවන ප්‍රශ්න පත්‍රය සඳහා | - | 60 |
| මුළු ලකුණු | - | 100 |

## II වන පත්‍රය

| | | |
|---|---|---|
| 1 වන අනිවාර්ය ප්‍රශ්නයට ලකුණු 02 බැගින් 10 | - | 20 |
| 2 වන - 7 වන ප්‍රශ්න සඳහා තෝරා ගත් ප්‍රශ්න 4 ලකුණු 10 බැගින් | - | 40 |
| | | 60 |

## කොටස් ලකුණු බෙදීම

2 - 6 දක්වා සෑම ප්‍රශ්නයක් සඳහා

| | | | |
|---|---|---|---|
| අ. | කොටසට - | ලකුණු | 2 |
| ආ. | කොටසට - | ලකුණු | 3 |
| ඉ. | කොටසට - | ලකුණු | 5 |
| | | | 10 |

7 වන ප්‍රශ්නයේ තෝරා ගත් සටහන් ලිවීමේ කොටස් 02 ට එක් කොටසට $5 \times 2 = 10$



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන්ම කළ යුතු වේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේ දී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ..........................................................
..........................................................
.......................................................... √ △ $\frac{4}{5}$

(ii) ..........................................................
..........................................................
.......................................................... √ △ $\frac{3}{5}$

(iii) ..........................................................
..........................................................
.......................................................... √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

01. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක් වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවක දී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

Download all Past Papers - https://bookbeekid.com/resource/past-papers/

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේ දී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු වේ. සියලුම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළ දී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.** අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු අදාළ තීරුවේ ඇතුළත් කළ යුතුය.

| | |
|---|---|
| සැ.යු :- | **සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස I වන පත්‍රය II වන පත්‍රය හෝ III වන පත්‍රය තීරුවේ ඇතුළත් කළ යුතුය. කිසිඳු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.** |

***



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**15 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2018**

| | |
|---|---|
| ක්‍රිස්තියානි ධර්මය | I, II |
| கிறிஸ்தவம் | I, II |
| Christianity | I, II |

2018.12.03 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ක්‍රිස්තියානි ධර්මය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ක්‍රිස්තු උපතට බොහෝ කලකට පෙර
(1) ශාස්තෘවරු හෙරොද් රජු බැහැදැකීමට ආහ.
(2) දිවැසිවරු උපත ගැන දිවැස් පළ කළහ.
(3) අන්නා සහ සිමියොන් මරියතුමිය බැලීමට ගියහ.
(4) උපත ගැන ස්නාවක ජොහාන් ප්‍රකාශ කළේ ය.

**2.** යෙසායා අනාගතවක්තෘ පැවසූ ලෙස ඉපදෙන දරුවාට දිය යුතු නම වන්නේ,
(1) එළියා ය. (2) මරනාතා ය. (3) ගාබ්‍රියල් ය. (4) එම්මානුවෙල් ය.

**3.** "මට පෙරටුව ගොස් මාගේ මාර්ගය පිළියෙල කරන්නා........" ලෙස මලාකි දිවැසිවරයා ප්‍රකාශ කළේ
(1) ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳව ය. (2) එළියා පිළිබඳව ය.
(3) ස්නාවක ජොහාන් පිළිබඳව ය. (4) නිකදේමුස් පිළිබඳව ය.

**4.** ස්නාවක ජොහාන් ජේසුස් වහන්සේ පිළිබඳ පැවසූ ප්‍රකාශය කුමක් ද?
(1) ලෝකයේ පව් දුරලන බැටළු පෝතකයාණෝ
(2) දෙවියන් වහන්සේගේ ආත්මය මා කෙරෙහි වේ
(3) මරන්න ගෙන යන බැටළුවකු මෙන් නිහඬ වන්නා
(4) මෙසියස් වහන්සේ

**5.** ජේසු උපත හා සම්බන්ධ සංකේත කිහිපයක් පහත දැක්වේ.
A - තරුව
B - එඬේරුන්
C - ශාස්තෘවරුන්/රජවරුන්
D - ගවලෙන
ඉහත සඳහන් සංකේත අතුරෙන් ශු.මතිව්ගේ සුබසුනේ සඳහන් වන්නේ,
(1) A සහ B ය. (2) A සහ C ය. (3) B සහ C ය. (4) C සහ D ය.

**6.** ජේසුස් වහන්සේගේ සේවය තුළ දක්නට ලැබූ අප ජීවිත තුළ අනුගත විය යුතු සුවිශේෂ ගුණාංග මොනවා ද?
(1) ඉවසීම, ප්‍රේමය හා සාධාරණත්වය
(2) ලිහිල් බව, නම්‍යශීලී වීම හා අනුන්ට අවනත වීම
(3) සාධාරණත්වය, ක්ෂණික තීරණ ගැනීම හා චාම් බව
(4) යාච්ඤාව, විශ්වාසය හා අනුනට අවනත වීම


Download all Past Papers> https://bookbeekid.com/resource/past-pa

**7.** ජුදා චාරිත්‍ර කිහිපයක් පහත දැක්වේ.

A - බෞතිස්මය  B - චර්ම ඡේදනය
C - නම් තැබීම  D - පවිත්‍ර කිරීම

මේවා අතුරෙන් වර්තමානයේ කිතුනුවන් ක්‍රියාත්මක කරන්නේ මොනවා ද?

(1) A සහ B  (2) A සහ C  (3) B සහ C  (4) C සහ D

**8.** මරියා සහ ජෝසප් සමග නාසරත් නුවරට ආපසු පැමිණි කාලයේදී ජේසු දරුවා

(1) අන් දරුවන්ට දෙවියන් වහන්සේ ගැන ඉගැන්වීමේ යෙදෙමින් වැඩුණි.
(2) සිනගෝග නායකයන් සමග වාද කිරීමේ යෙදුණි.
(3) ශක්තියෙන් හා ප්‍රඥාවෙන් පූර්ණව දෙවියන් වහන්සේගේ සහ අන් අයගේ ප්‍රසාදයෙන් වැඩුණි.
(4) යම් දිනෙක දේව වචනයෙන් සාමය බලාපොරොත්තුවෙමින් වැඩුණි.

**9.** ගලීලයේ නාසරෙත් නුවර ජනතාවට ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ ප්‍රකාශ පහත දැක්වේ.

A - "වෙදතුමනි, ඔබම සුව කර ගන්න."
B - "දියඹට ගොස් දැල් හෙළන්න."
C - "ගමේ දිවැසිවරයා ගමට අගේ නැත."
D - "කතා නොකර මොහුගෙන් පිටතට එන්න."

මේවායින් නාසරෙත්හි සිනගෝගයේ දේශනයට අයත් වන්නේ

(1) A සහ B ය.  (2) A සහ C ය.  (3) B සහ C ය.  (4) C සහ D ය.

**10.** ජේසුස් වහන්සේගේ සේවයට සම්බන්ධ මුහුද හඳුන්වනු ලැබූ නම් තුන වන්නේ

(1) ගලීල මුහුද, ජෝර්දාන් ගඟ හා මධ්‍යධරණී මුහුද ය.
(2) ගලීල මුහුද, බෙත්සෙයිදා පොකුණ හා මධ්‍යධරණී මුහුද ය.
(3) ගලීල මුහුද, මධ්‍යධරණී මුහුද හා තිබේරියන් මුහුද ය.
(4) ගලීල මුහුද, තිබේරියස් මුහුද හා ගෙනසරත් විල ය.


**11.** වර්තමාන ගෝලකමට කැඳවනු ලැබූ ඔබ ප්‍රේරිතකම තේරුම් ගත යුත්තේ,

(1) අර්ධ කාලීන සේවය සඳහා කැප වීමෙන් ය.
(2) පූර්ණ කාලීන සේවය සඳහා මැලි නොවී ඉදිරිපත් වීමෙන් ය.
(3) විශේෂ මෙහෙයක් සඳහා පුහුණු කර යවන කෙනෙක් වීමෙන් ය.
(4) දිනපතා කුරුසිය රැගෙන යාමට අන් අයට මතක් කර දීමෙන් ය.

**12.** ජේසුස් වහන්සේ අනුව දේව වචනය අසා එය පිළිපදින්නෝ කවරහු ද?

(1) වචනය අන් අය සමග බෙදාගන්නා අයවලුන් ය.
(2) වචනය අසන්නන් වීම ය.
(3) ජේසුස් වහන්සේගේ මව සහ සහෝදරයන් ලෙස හඳුන්වන්නන් ය.
(4) ජේසුස් වහන්සේගේ වචනය අසා එය මෙනෙහි කරන අය වේ.

**13.** ජේසුස් වහන්සේ සමග සම්බන්ධ වූ පුද්ගලයින් කිහිපදෙනකු පහත දැක්වේ.




ඉහත සඳහන් අය සම්බන්ධයෙන් පොදු ලක්ෂණය වනුයේ,

(1) මොවුන් ජේසුස් වහන්සේගේ ගෝලයන් 12ට එකතු වීම ය.
(2) මොවුන් ජේසුස් වහන්සේගේ රහසිගත අනුගාමිකයන් වීම ය.
(3) මොවුන් ජේසුස් වහන්සේගේ සේවයට උපස්ථාන කිරීම ය.
(4) මොවුන්ගේ නිවෙස්වලට ජේසුස් වහන්සේ වැඩම කිරීම ය.


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**14.** 'විජාතීන්ගේ අපෝස්තුළුවරයා' ලෙස හැඳින්වෙන්නේ,
(1) පේදුරුතුමා ය.
(2) ලූක්තුමා ය.
(3) පාවුල්තුමා ය.
(4) ස්නාවක ජොහාන්තුමා ය.

**15.** සියලු භේද අභිබවා අන්‍යයන්ට උපකාර කිරීමට කැපවීමේ වැදගත්කම අනාවරණය කිරීමට ජේසුස් වහන්සේ ගෙනහැර පෑ උපමාව,
(1) පරිසියා සහ අයකැමියා ය.
(2) නැතිවූ පුත්‍රයා ය.
(3) යහපත් සමාරිතයා ය.
(4) ධනපතියා සහ ලාසරස් ය.

**16.** කිතුනු වටිනාකම්වලට එල්ල වන අභියෝගවලට මුහුණ පෑමේදී ජේසුස් වහන්සේ පරිසි හා සද්දුසිවරුනට දැක්වූ ප්‍රතිචාර මගින් අපට උගන්වන්නේ,
(1) ඔවුන් සතුටු කිරීමට ක්‍රියා කර, ඔවුන්ගේ සිත් දිනා ගැනීම ය.
(2) ඔවුනට විරුද්ධව ක්‍රියාකරමින් සමාජයේ ජය ලබා ගැනීම ය.
(3) ඔවුනට ප්‍රතිවිරුද්ධ ප්‍රශ්න යොමු කර පරාජයට පත් කිරීම ය.
(4) ඔවුන්ගේ සැබෑ ප්‍රශ්න හා එසේ නොවන ඒවා හඳුනාගෙන නිසි ප්‍රතිචාර දැක්වීම ය.

**17.** "පරීක්ෂාවට නොවැටෙන පිණිස නැගිට යාච්ඥා කරන්න." යන ඉල්ලීම ඔබ මිතුරනට කියා සිටින්නේ,
(1) ඔවුන්ට භාරදූර කාර්යයක් ඉටු කිරීමට සිදුවන අවස්ථාවක ය.
(2) ඔබ සමග ඔවුන් විනෝද වෙමින් සිටින අවස්ථාවක ය.
(3) ඔවුන් පීඩාවට පත්ව නිදිබරව සිටින අවස්ථාවක ය.
(4) ඔවුන් අලසව සිටින අවස්ථාවක ය.

**18.** අපචාරයට ලක්වන ලාංකික දරුවන් වෙනුවෙන් කිතුනු සභා සංවිධාන ගත යුතු වැදගත් ක්‍රියාමාර්ගයක් වන්නේ,
(1) දෙමාපියන් හා දරුවන් සඳහා දැනුවත් කිරීමේ ව්‍යාපෘති දියත් කිරීම ය.
(2) දරුවනට ජීවිතය ගෙනයාමට අවශ්‍ය මුදල් සපයා දීම ය.
(3) දේශපාලනයට පිවිස මේ තත්ත්වය ගැන ක්‍රියා කිරීම ය.
(4) බලධාරීන් දැනුවත් කර පුනරුත්ථාපනයේ වැදගත්කම ඉදිරිපත් කිරීම ය.

**19.** පිලිප්පියේ හිර ගෙදරදී වද හිංසා රැසකට මුහුණ පා අත්අඩංගුවේ සිටි පාවුල් සහ සීලස්ගේ ක්‍රියාකලාපයෙන් අප ලබන පණිවුඩය කුමක් ද?
(1) අසාධාරණකමේ විපාකය ගැන එරෙහිවීම
(2) දුක්විඳීම මධ්‍යයේ වුව ද දෙවියන් වහන්සේට ප්‍රශංසා කර යාච්ඥා කිරීම
(3) මුර සෙබලාට දේශනා කර බෞතිස්ම කිරීම
(4) සිර අඩස්සියේ සිටිය දී වර්ජනයක යෙදීම

**20.** පහත දැක්වෙන සිද්ධි අතුරෙන් ජේසුස් වහන්සේට සේවය කිරීම හා වත් පිළිවෙත්වලට වහල් වීම අතර වෙනස පෙන්නුම් කරන සිද්ධි මොනවා ද?
A - දොළොස් හැවිරිදි ජේසුස් වහන්සේ දේව මාලිගයට ගෙන යෑම
B - කෑමට පෙර අත් සේදීමේ පිළිවෙත ඉටු නොකළ බව දැක පුදුම වූ පරිසිවරු
C - පාස්කු මංගල්‍යයට දේව මාලිගයට යෑම
D - ජේසුස් වහන්සේ සබත් දිනයේ අත පණ නැති මිනිසා සුවපත් කිරීම
(1) A සහ B (2) B සහ C (3) B සහ D (4) C සහ D

**21.** ජේසුස් වහන්සේගේ විනිශ්චය මගින් අපට ඉදිරිපත් වන වැදගත් පාඩමක් වන්නේ,
(1) සෑම විටම නීතිය සාධාරණව ඉටු වන බවයි.
(2) සෑම නඩු විභාගයකදීම වරදකරුට කතා කිරීමේ නිදහස අත්වන බවයි.
(3) නීතිය හමුවට ගෙනෙන ඕනෑම පුද්ගලයකුට නිදහස ලැබෙන බවයි.
(4) නිදොස් පුද්ගලයා වරදකරු වීමට ඉඩප්‍රස්ථා ඇති බවයි.

**22.** පහත දැක්වෙන්නේ ජේසුස් වහන්සේගේ දුක්විඳීම සහ මරණය සම්බන්ධ කියමන් කිහිපයකි.
A - "ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝ ය."
B - "ඔබ යළිත් හැරුණු පසු ඔබේ සහෝදරයින් ධෛර්යමත් කරන්න."
C - "ජේසුස් වහන්ස ඔබ රාජශ්‍රීයෙන් වඩිනා කල මා සිහි කළ මැනවි."
D - "ඔබ ජුදෙව්වරුන්ගේ රජ නම් ඔබ ඔබවම ගලවා ගන්න."
මේවා අතුරෙන් කුරුසිපත්ව සිටි ජේසුස් වහන්සේට ඉදිරිපත් කළ ප්‍රකාශ වන්නේ
(1) A සහ B ය. (2) A සහ C ය. (3) B සහ C ය. (4) C සහ D ය.


Download all Past Papers> https://bookbeekid.com/resource/past-pa

23. හිස්වූ සොහොන, සිඳුරු වූ අත්පා යන සත්‍ය අත්දැකීම මගින් එළිදරව් වන්නේ,
(1) ජේසුස් වහන්සේ ජීවමාන බව ය.
(2) ජේසුස් වහන්සේ දුක් විඳින බව ය.
(3) ජේසුස් වහන්සේ කුරුසිපත් වූ බව ය.
(4) ජේසුස් වහන්සේ රූප විපර්යාස වූ බව ය.

24. පහත සඳහන් වන්නේ ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකාරීත්වයයි.
A - ශුද්ධාත්මයාණෝ පරවියකුගේ ස්වරූපයෙන් පහළ වීම
B - ශුද්ධාත්මයාණන් හා ගින්නෙන් බෞතිස්ම ලැබීම
C - ස්වර්ගය විවර ශුද්ධාත්මයාණෝ පහළ වීම
D - රූප විපරියාසයේදී ශුද්ධාත්මයාණෝ පහළ වීම

ජේසුස් වහන්සේ බෞතිස්ම ලැබූ අවස්ථාවේ අත්දුටු ශුද්ධාත්ම ක්‍රියාකාරීත්ව වන්නේ,
(1) A සහ B ය. (2) A සහ C ය. (3) B සහ C ය. (4) C සහ D ය.

25. ස්තුතිවන්ත සහ කෘතඥභාවය ඉස්මතු කරමින් ජේසුස් වහන්සේ එම ක්‍රියාව අගය කළේ
(1) අතක් පණ නැති මිනිසා සුවපත් කළ අවස්ථාවේ ය.
(2) ලාදුරු රෝගීන් දසදෙනා අතුරෙන් සුවය ලැබූ එක් අයකු සාමාරිතයකු වීම ය.
(3) අන්ධ බර්තේමියුස් සුවය ලබා ප්‍රීති වූ අවස්ථාවේ ය.
(4) මහලේ රෝගියා සුවපත් කළ අවස්ථාවේ ය.

26. ජේසුස් වහන්සේ පවුල් සංකල්පයට නව පුළුල් අරුතක් ගෙන දුන්නේ,
(1) අවුරුදු 12 වයසේදී දෙමාපියනට කීකරු වීමෙන් ය.
(2) පවුලේ යාච්ඤාව ගෝලයනට ඉගැන්වීමෙන් ය.
(3) මගේ වචනය අසා එය පිළිපදින්නන් මාගේ මෑණියන් සහ සහෝදරයන් ලෙස පැවසීමෙන් ය.
(4) ජේරුසලමේ දෙව් මැඳුරේ තම පියාණන් දෙවියන් වහන්සේ බව කීමෙන් ය.

27. "සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝ ය. ............" මෙම ජේසුස් වහන්සේගේ ප්‍රකාශය සම්පූර්ණ කිරීමට සුදුසු වරණය තෝරන්න.
(1) ඔවුහු දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුළු වන්නාහු ය.
(2) ඔවුහු දෙවියන් වහන්සේගේ සමාජය තුළ අගය කරනු ලබන්නාහු ය.
(3) ඔවුහු දෙවියන් වහන්සේ දකින්නාහු ය.
(4) ඔවුහු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝයි කියනු ලබන්නාහු ය.

28. පාපීය ස්වභාවය ඒත්තුගෙන පිවිතුරු ජීවිතයකට පිවිසීමේ අභියෝගය ඉදිරිපත් කළ දිවැසිවරයා,
(1) ආමෝස් ය. (2) යෙසායා ය. (3) මීකා ය. (4) ජෙරමියා ය.

29. සමාජය තුළ දේව රාජ්‍යයේ වටිනාකම් අනුව සංවේදී වීම සඳහා පහත දැක්වෙන කුමන ප්‍රකාශය සෘජුව සම්බන්ධ වේ ද?
(1) ඉස්තරම් වස්ත්‍ර ඇඳගත් අය හා දිළිඳු අය හට වෙනස් සේවයක් කිරීම ය.
(2) මා සාගිනිව සිටියෙමි. ඔබ මට කන්නට දුන්නා හුය. පිපාසව සිටියෙමි. බොන්නට දුන්නාහු ය.
(3) ආණ්ඩු බලය හා අධිකාරී බලය ඇති අයට යටත්ව සිටින්න.
(4) තම ජීවිත අවශ්‍යතාව ද සපුරා ගන්නා අතර සමාජ යහපතට ද වැඩ කරන්න.

30. පහත සඳහන් ප්‍රකාශවලින් පෙන්තකොස්ත දින පේදුරුතුමාගේ ප්‍රබල දේශනය මගින් අවධාරණය කෙරුණු හා සිදු වූ සමහර දේ සම්බන්ධ නිවැරදි ප්‍රකාශ මොනවා ද?
A - ඔබ කුරිසිපත් කළ ජේසුස් වහන්සේ උත්ථානව අප අතර සිටින බව කීම
B - ඉශ්‍රායෙල් වංශයේ ප්‍රබලතාවය පහදා දීම
C - පේදුරු තම ජීවිතයේ පසුබිම විස්තර කිරීම
D - 3000ක් පමණ ජනතාව ජේසුස් වහන්සේ පිළිගැනීම

(1) A සහ B (2) A සහ D (3) B සහ C (4) C සහ D

31. මෙසියස් වහන්සේ තුළින් අප ජීවිතවලට ලැබෙන ආලෝකය.
(1) සාමය සහ සංහිඳියාවයි.
(2) රෝගවලින් නිදහසයි.
(3) දේශපාලන නිදහසයි.
(4) සෑම අංශයකින් ම පරිපූර්ණ ජීවනය ලැබීමයි.

32. මුල් සභාවේ නමස්කාර ජීවිතයේ වැදගත්කමට අදාළ **නොවන** සාධකය වන්නේ,
(1) සබත් නීතියට අනුකූලව ක්‍රියා කිරීම ය.
(2) රොටි කැඩීම සඳහා එක් වීම ය.
(3) යාච්ඤාව තුළින් තම ජීවිත සවිමත් කර ගැනීම ය.
(4) දේව වචනයේ ඉගැන්වීම අනුව ජීවිත හැඩගස්වා ගැනීම ය.

Download all Past Papers>. https://bookbeekid.com/resource/past-papers/

**33.** "දොරටුව මම වෙමි. මා තුළින් යමෙක් ඇතුළු වන්නේ ද ගළවනු ලැබ.......ආහාර ලබන්නේ ය." මෙයින් ජේසුස් වහන්සේ අදහස් කළේ,
(1) දේව මාලිගයේ ප්‍රධාන දොරටුවෙන් ඇතුළුවීමේ භාග්‍යයයි.
(2) සෑම ඉරුදිනකම දේවස්ථාන නමස්කාරයට පිවිසීමෙන් පූර්ණ වීමයි.
(3) ජේසුස් වහන්සේ සියලු ආහාරපානාදිය සපයා පරිපූර්ණ කිරීමයි.
(4) ජේසුස් වහන්සේ පිළිගෙන එතුමා අනුගමනය කරන්නා ගැළවීම ලබන බවයි.

**34.** මෝසස්ගේ ජීවිතය තුළින් කිතුනු අප අනුගත කරගත යුතු වටිනාම ගුණාංගය වන්නේ,
(1) ඔහු සිය පවුල සමග නව දේශයකට අවතීර්ණ වීමයි.
(2) ඔහු තුළ ඇති හැකියාවන් කෙරෙහි විශ්වාසයෙන් ක්‍රියා කිරීමයි.
(3) අවිනිශ්චිතභාවය මධ්‍යයේ නායකත්වය දැරීමයි.
(4) තම ආත්ම විශ්වාසය කෙරෙහි බලාපොරොත්තුවෙන් ක්‍රියා කිරීමයි.

**35.** ඒකත්වය පිළිබඳ ජේසුස් වහන්සේගේ ප්‍රකාශය කුමක් ද?
(1) හිස වන උන්වහන්සේ කරණකොට ගෙන මුළු ශරීරය ඒකාබද්ධ කරනු ලැබේ.
(2) ජුදෙව්වන් හා විජාතීන් අතර වෛරය නැමති බිත්තිය කඩා දැමීම ය.
(3) ජුදෙව් ග්‍රීක, දාස නිර්දාස භේදයක්වත් ස්ත්‍රී පුරුෂ භේදයක්වත් නැත.
(4) එකම එඬේරෙක් ද, එකම රැළක් ද වන්නේ ය.

**36.** ජේරුසලමේ මන්ත්‍රණ සභාව හා බැඳි සාධකයක් **නොවන්නේ,**
(1) සැත්තෑ දෙනෙකුගෙන් සමන්විත සභාවක් වීමයි.
(2) පාවුල්ගේ ප්‍රථම ධර්ම දූත සේවයෙන් පසු කැඳවනු ලැබීමයි.
(3) ජුදෙව් හා විජාතික අය අතර ඇති ගැටලු නිරාකරණය කිරීමයි.
(4) මෙහි නායකත්වය ජාකොබ්තුමා දැරීමයි.

**37.** පාවුල්තුමා සිරකරුවකු ලෙස කුණාටුවට හසුවී සිටි අවස්ථාවේ ඔහුගේ ක්‍රියාකලාපය කිතුනු අප අර්බුදවලට මුහුණ-පාන විට අදාළ කරගත හැක්කේ
(1) ජීවිතයේ කුණාටුවලට මුහුණ නොදීමට වග බලා ගැනීමෙනි.
(2) ජීවිතයේ කුණාටු අවස්ථාවල පමණක් අන් අයගේ පිහිට පැතීමෙනි.
(3) කරදර ගෙන එන සමාජයේ පුද්ගලයන්ට චෝදනා කිරීමෙනි.
(4) ඇදහිල්ලෙන් ස්ථිරව සිටිමින් අන් අය දිරිගැන්වීමෙන් ක්‍රියා කිරීමෙනි.

**38.** දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති ගෙනහැර පෑමට ජේසුස් වහන්සේ යොදාගත් උපමා මොනවා ද?
(1) අයකැමියා සහ පරිසියා, නැති වූ බැටළුවා
(2) මහා මංගල භෝජනය, නැතිවූ බැටළුවා
(3) නැතිවූ කාසිය, අඹ ඇටයේ උපමාව
(4) මහා මංගල භෝජනය, තලෙන්ත පිළිබඳ උපමාව

**39.** මුර අට්ටාලයක් සෑදීම හා රජකු යුද්ධයට යෑමට පෙර යන නිදසුන් ගෙනහැර පෑමෙන් ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ අභියෝගය වන්නේ,
(1) මමත්වය නසා දැමීමේ වැදගත්කම ය.
(2) තම ජීවිත පවා විනාශ කරගන්නට සිදුවන බව ය.
(3) ගෝලකමට පිවිසීමට පෙර තීරණ ගැනීමේ වැදගත්කම ය.
(4) කුරුසිය දරාගෙන යෑමට සූදානම් වීමේ අවශ්‍යතාව ය.

**40.** පහත සඳහන් වන්නේ ජේසුස් වහන්සේ පරීක්ෂාවනට දුන් ප්‍රතිචාර ය.
A - "මිනිසා ජීවත් වන්නේ කෑමෙන් පමණක් නොව, දෙවියන් වහන්සේගේ මුවින් නික්මෙන සියලු වචනවලින් ය."
B - "සාතන් මාගෙන් පස්සට යයි."
C - "නුඹේ දෙවි වූ ස්වාමීන් වහන්සේට පමණක් නමස්කාර කරන්න. උන්වහන්සේට පමණක් සේවය කරන්න."
D - "නුඹේ දෙවි ස්වාමීන් වහන්සේ පරීක්ෂා නොකරන්න."
මේවා අතුරෙන් පාළුකරයේදී පරීක්ෂාවනට දුන් ප්‍රතිචාර වන්නේ,
(1) A සහ B ය. (2) B සහ C ය. (3) B සහ D ය. (4) C සහ D ය.

* *


Download all Past Papers> https://bookbeekid.com/resource/past-pap

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2018
## க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2018

| විෂයය අංකය<br>பாட இலக்கம் | 15 | විෂයය<br>பாடம் | ක්‍රිස්තියානි ධර්මය |
|---|---|---|---|

## I පත්‍රය - පිළිතුරු

## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 3 | 21. | 4 | 31. | 4 |
| 02. | 4 | 12. | 3 | 22. | 4 | 32. | 1 |
| 03. | 3 | 13. | 4 | 23. | 1 | 33. | 4 |
| 04. | 1 | 14. | 3 | 24. | 2 | 34. | 3 |
| 05. | 2 | 15. | 3 | 25. | 2 | 35. | 4 |
| 06. | 1 | 16. | 4 | 26. | 3 | 36. | 1 |
| 07. | 2 | 17. | 1 | 27. | 4 | 37. | 4 |
| 08. | 3 | 18. | 1 | 28. | 2 | 38. | 2 |
| 09. | 2 | 19. | 2 | 29. | 2 | 39. | 3 |
| 10. | 4 | 20. | 3 | 30. | 2 | 40. | 4 |

විශේෂ උපදෙස් } එක් පිළිතුරකට ලකුණු **01** බැගින்
விசேட அறிவுறுத்தல் } ஒரு சரியான விடைக்கு **01** புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තර පත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව<br>சரியான விடைகளின் தொகை | 25<br>40 | I පත්‍රයේ මුළු ලකුණු<br>பத்திரம் I இன் மொத்தப்புள் | 25<br>40 |
|---|---|---|---|



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers

## II වන ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථ

නිපුණතා සහ දැනුම වර්ධනය කිරීම මෙම ප්‍රශ්න පත්‍රය තුළින් අපේක්ෂා කෙරේ. ප්‍රශ්න සියල්ල පදනම් වී ඇත්තේ 10,11 වසර පෙළ පොත් දෙක හා ශුද්ධ බයිබලය ඇසුරෙන්ය. I වන ප්‍රශ්නය අනිවාර්ය වේ. පිළිතුරු නිශ්චිත විය යුතුය. සෙසු ව්‍යුහගත ප්‍රශ්නවල 3 වන කොටස සිසුන්ගේ ආකල්ප හා නිපුණතා වර්ධනයට යොමු කෙරේ. එහෙයින් එම කොටසට වැඩි ලකුණු පිරිනැමේ. පිළිතුරු පතෙහි සඳහන් නොවූවත් එම කොටසට/ ප්‍රශ්නයට අදාළ සිසු අත්දැකීම් ඉදිරිපත් කර ඇත්නම් ලකුණු ප්‍රදානය කළ හැකිය.

### ලකුණු දීමේ උපදෙස්

I වන අනිවාර්ය ප්‍රශ්නයට කොටස් 10ක් ඇතුළත්ය. එක් කොටසකට ලකුණු 02 බැගින් පිරිනැමේ.

10 x 2 = 20

සෙසු තෝරාගත් ප්‍රශ්නවලට ලකුණු පිරිනැමිය යුත්තේ -

| | ලකුණු |
|---|---|
| (i) වන කොටසට | 02 |
| (ii) වන කොටසට | 03 |
| (iii) වන කොටසට | 05 |
| මුළු ලකුණු සංඛ්‍යාව | 10 |

තෝරාගත් ප්‍රශ්න 4 ට 10 x 4 = 40

07 වන ප්‍රශ්නයේ කොටස් 2 ට ලකුණු 05 බැගින් (2 x 05 = 10)

II වන ප්‍රශ්න පත්‍රයේ මුළු ලකුණු සංඛ්‍යාව 60 කි.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-pap

1. (i) "අපට දරුවෙක් උපන්නේ ය. ......... එතුමාණන් අසිරිමත් උපදේශකයාණෝ ය. සාමයේ කුමාරයාණෝ යැයි කියනු ලබන්නෝ ය." ජේසුස් වහන්සේ ගැන මෙම අනාවැකිය ප්‍රකාශ කළේ කුමන දිවැසිවරයා ද? මෙම අනාවැකිය පූර්ණ වූයේ කවුරුන් තුළින් ද?

යෙසායා දිවැසිවරයා විසින්
ජේසුස් වහන්සේ / මෙසියස් වහන්සේ (ලකුණු 02)

(ii) පහත සඳහන් දේව ප්‍රකාශ ඉදිරිපත් කෙරුණේ කුමන අවස්ථාවලදී ද?
(අ) "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ ය. ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමි."
(ආ) "මේ මාගේ පුත්‍රයාණෝ ය. මා තෝරාගත් තැනැත්තාණෝ ය. මොහුහට සවන් දෙන්න."

ජේසුස් වහන්සේගේ බෞතිස්මය
ජේසුස් වහන්සේගේ අන්වෙසක් වීම/රූප විපර්යාසය (ලකුණු 02)

(iii) (අ) ජුදෙව් පාස්කු මංගල්‍යය මගින් ඔවුන් සමරන්නේ කුමන සිද්ධියක් ද?
(ආ) කිතුනු පාස්කුව වැදගත් වන්නේ කෙසේ ද?

යුදෙව්වන් සමරන්නේ මිසරයේ වහල් බවින් මිදීම පසු කරයැම මංගල්‍යය
කිතුනුවන් පාස්කු දිනයේ සමරන්නේ ජේසුස් වහන්සේගේ උත්ථානය මගින් පාපයෙන් ගැළවීමයි (ලකුණු 02)

(iv) මරණය අභිබවා ජේසුස් වහන්සේ ආශ්චර්ය ක්‍රියා කර, නව ජීවිතයක් උදාකර දුන් අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

ජායිරස්ගේ දියණිය මරණයෙන් උත්ථාන කිරීම
නායින් නුවර වැන්දඹුවගේ පුත්‍රයා මරණයෙන් උත්ථාන කිරීම
ලාසරස් මරණයෙන් උත්ථාන කිරීම (ලකුණු 02)

(v) ජේසුස් වහන්සේ කුරුසියේ දිවි පිදූ අවස්ථාවේදී සොබා දහම දැක්වූ පුදුමාකාර ප්‍රතිචාර **දෙකක්** ලියන්න.

පැය තුනක කාලයක් ලොව පුරා අඳුරෙන් වැසී යාම
තද භූමි කම්පාවක් සිදුවීම

(ලකුණු 02)

(vi) (අ) සමාජයේ සාධාරණයක් ගෙනඒමට ස්නාවක ජොහාන් ඉදිරිපත් කළ අභියෝගය කුමක් ද?
(ආ) මුල් කිතුනු සභාව සමාජ සාධාරණත්වය ස්ථාපිත කිරීමට ක්‍රියා කළේ කෙසේ ද?

a) ඇඳුම් දෙකක් ඇති අය නැති අයට දේවා , කෑම ඇති අයද එසේම කෙරේවා
අයකැමියන්ට ද හේවායන්ටද දුන් අවවාද ඇතුලත් විය හැකිය.

b) සියලු දේ පොදු වේ තබාගෙන නැති අය අතර බෙදා දීම.
හත් දෙනෙකු පත්කර ග්‍රීක වැන්දඹුවන්ගේ අවශ්‍යතා සඳහා යොමු වීම
ජේරුසලමේ මන්ත්‍රණ සභාවේ පොදු තීරණ මගින් අන්‍යජාතීන් පිළිගැනීම

(ලකුණු 02)

(vii) සේවක නායකත්වයේ ගුණාත්මක බව ඉස්මතු කර දැක්වීමට ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ අවස්ථා **දෙකක්** ලියන්න.

ගෝලයන්ගේ පාද සේදීම
කුඩා දරුවන් අගයකොට පිළිගැනීම
අවශ්‍යතා අනුව ආරාධිතයන්ගේ නිවෙස්වලට වැඩම කිරීම
තම ජීවිතය පවා මනුෂ්‍යයා වෙනුවෙන් පිදීම

(ලකුණු 02)


Download all Past Papers> https://bookbeekid.com/resource/past-pape

(viii) සමාවීමේ වැදගත්කම දැක්වීමට ජේසුස් වහන්සේ ක්‍රියා කළ අවස්ථා **දෙකක්** ඉදිරිපත් කරන්න.

කුරුසිය මත සිටින අවස්ථාවේ දී පවා තමා කුරුසිපත් කළ අයට පවා සමාව යැදීම
කාම මිත්‍යාචාර වරදට බැඳි කාන්තාව ගල් ගසා මැරීම වෙනුවට සමාව දීම
අංශභාග රෝගියාට පව් සමාව දීම

**(ලකුණු 02)**

(ix) "මනුෂ්‍යයෙනි, ඔබ මේ දෙවල් කරන්නේ මන් ද? අපිත් ඔබ හා සමාන මිනිසුන් ය."

(අ) මෙසේ පාවුලුතුමා ජනතාවට ප්‍රකාශ කළේ කුමන නගරයේදී ද?

(ආ) එමගින් කිතුනු සේවකයනට ප්‍රදානය කරන පණිවුඩය කුමක් ද?

ලුස්ත්‍රාවේදීය

හාස්කම් කළ අවස්ථාවේ ඔවුනට කළ ගෞරවය නිහතමානීව ප්‍රතික්ෂේප කර එම
ගෞරවය දෙවියන් වහන්සේට ඔප්පු කිරීම

**(ලකුණු 02)**

(x) "යමෙක් **නැවත නූපන්නොත්** ඔහුට දෙවියන් වහන්සේගේ රාජ්‍යය දැකගත නොහැක."

(අ) ජේසුස් වහන්සේ මෙසේ කීවේ කා හට ද?

(ආ) මෙහි තද කළු අකුරින් ලියවී ඇති පදයෙන් කුමක් අවධාරණය කළ සේක් ද?

මෙසේ පැවසුවේ රාත්‍රි කාලයේ එතුමා හමුවීමට පැමිණි නිකදේමුස්ටය දේව රාජයේ
ගුණාංග අනුව ආත්මික නව ජීවනයකට පැමිණීමේ අවශ්‍යතාවය දැක්වීමටය

**(ලකුණු 02)**

**2.** "ස්වාමීනි වෙහෙස නොවන්න, ඔබ මාගේ පියස්ස යටට වැඩමවා ගැනීමට මම නොවටිමි. .........."

(i) මෙසේ පැවසුවේ කවුරුන් විසින් ද? ඔහු කෙබඳු තත්ත්වයක් දැරූ කෙනෙක් ද?

මෙසේ පැවසුයේ ශතාධිපතියාට ය. ඔහු භේවායින් 100 ක් බලයලත් විජාතික පුද්ගලයෙකි

(ii) මෙයට පසුබිම් වූ අවස්ථාව ලුහුඬින් විස්තර කරන්න.

තම සේවකයා ඉතා රෝගාතුරව සිටින බැවින් සුවය ලබා දීමට ජේසුස් වහන්සේ වෙත
පැමිණි අවස්ථාව. ඔහු දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය ඇති කෙනෙක්ය
ඔහුගේ නොවටිනාකම ජේසුස් වහන්සේ ඉදිරියේ පිළිගත්තේය

(iii) ඉහත සඳහන් ප්‍රකාශය මගින් අපට අනුගත කරගත හැකි එම පුද්ගලයාගේ විශේෂ චරිත ලක්ෂණ හා ජේසුස් වහන්සේ විසින් ඉස්මතු කළ ගුණාංගය පහදන්න.

මොහුගේ ක්‍රියාකලාපය මගින් ඉස්මතුකරන චරිත ලකෂණ වනුයේ
යටහපත් පහත් කම
බලය ගැන පාරට්ටු නොකිරීම
දෙවියන් වහන්සේ කෙරෙහි තිබූ අචල විශ්වාසය
සිය සේවකයා වෙනුවෙන් ක්‍රියා කිරීම
මොහුගේ විශ්වාසය ගැන ජේසුස් වහන්සේ මව්තය ප්‍රකාශ කලේය.

**(2+3+5 = ලකුණු 10)**



Download all Past Papers> https://bookbeekid.com/resource/past-paper

3. 'කාන්තා විමුක්ති පෙරමුණ' අද ලොව බොහෝ රටවල උද්ගතව ඇති සංදර්භයකි.

(i) එවකට ජුදා සමාජයේ කාන්තාවන්ගේ තත්ත්වය කෙබඳු වී දැයි පෙන්වීමට සාධක **දෙකක්** ඉදිරිපත් කරන්න.

එකල ජුදා සමාජයේ කාන්තාවනට සමාජයේ ප්‍රසිද්ධ තැනක් නොවීම
තීරණ ගැනීමට අවස්ථාවක් නොතිබුනි
ප්‍රසිද්ධ ස්ථානවල පුරුෂ පක්ෂය සමග කථා කිරීම පවා සීමා විය
ගෙදර දොරේ වැඩ කටයුතු හා ළමුන් හදාවඩා ගැනීමට ඔවුන් සීමා විය
දේවා මාලිගයේ තුළ මොවුනට තිබුනේ වෙනම තැනක් ය

(ii) ජේසුස් වහන්සේ කාන්තාවන්ට සමාජයේ නිසි තැනක් හිමිකර දීමට ගත් පියවර **තුනක්** ලුහුඬින් ලියන්න.

ජේසුස් වහන්සේ තම ගෝල පිරිසට කාන්තාවන් එක් කර ගැනීම. මාර්තා සහ මරියාගේ නිවසේ දී මරියාගේ ක්‍රියා කලාපය සුදුසු බව පැවසීමෙන් දේව රාජ්‍යයේ වැඩට සම්බන්ධ වීමේ වැදගත් කම දැක් විය. මහලේ රෝගියාට ජේසුස් වහන්සේගේ වස්ත්‍රය අතගැසීම පවා ප්‍රතික්ෂේප නොකිරීම. සමාරිය ස්ත්‍රියට යහමග දැක්වීම පවුකාර ස්ත්‍රියටය කමාවූ සේක.

(iii) ශ්‍රී ලාංකික සමාජයේ කාන්තා අයිතිවාසිකම් නගා සිටුවීමට ජේසුස් වහන්සේගේ ආදර්ශය අනුව කිතුනුවන් ගත යුතු ක්‍රියාමාර්ග **පහක්** විස්තර කරන්න.

- රැකියා ස්ථානවල සම තත්වයක් ලබා දීමේ වගකීම.
- පවුල තුල සැම දෙනා එක හා සමානව පිළිගැනීම.
- අයුක්ති ලෙස කාන්තාවනට හිමි අවස්ථා පැහැර හැරීමේ දී ඒ සඳහා හඬක් නැගීම
- දේව රජ්‍යයේ වැඩ කටයුතු වලට සහභාගී වීමේ අවස්ථාව සලසා දීම
  උදා :- කාන්තා පූජකත්වය
- ගෘහස්ත ප්‍රචන්ඩත්වය වැලැක්වීමට ක්‍රියා කිරීම
- නිවස තුළ දී පිරිමි හා ගැහැණු දරුවන්ට එක හා සමානව සැලකිල්ලක් දැක්වීම

**(2+3+5 = ලකුණු 10)**

4. (i) පාවුල්තුමාගේ නව ජීවිත පරිවර්තනය හුවා දක්වන සාක්ෂි කවරේ ද?

- දමස්කයේ කිතුනුවන්ට පීඩා කිරීමට යන මග දී ජේසුස් වහන්සේ මුණ ගැසීම. ස්වාමිනි කියා පිළිගැනීම
- මුල් අවස්ථාවේ ඔහු ප්‍රතික්ෂේප කළ ගොලයන් සමග මිත්‍ර වී පිළි ගැනීම
- කිතුනු මර්දනය වෙනුවට දේව වචනය ප්‍රකාශ කිරීමටත් වර්ධනයටත් එළඹීම
- යුදෙව් විරෝධතා මධ්‍යයේ ධෛරයෙන් ජේසුස් වහන්සේ වෙනුවෙන් සේවයේ යෙදීම
- ජේසුස් වහන්සේ දේව පුත්‍රයා බව තරයේ ප්‍රකාශ කිරීම

(ii) එතුමාගේ ජීවිත පසුබිම ඔහුගේ ධර්ම දූත සේවයේ ද පිටිවහලක්වූ අවස්ථා **තුනක්** උදාහරණ සහිතව පහදන්න.

- ජුදෙව්වෙක් හා පරිසියෙක් වීම නිසා - ධර්මශාලා තුළට පිවිස දේශනා කිරීමේ වරම
- රෝම පුරුවැසි භාවය - පිලිප්පියේ සිරගෙදරදී නිදහස ලැබීම. සීසර්ගේ විනිශ්චය ඉල්ලීමේ අවස්ථාව
- තාර්සස් නුවර උපත ලැබීම - විජාතීන් ඇසුරු කිරීමට හා ඔවුන්ගේ භාෂා වත්පිලිවෙත් ගැන මනා අවබෝධයක් ලැබීම. එහි ලැබූ අධ්‍යාපනය නිසා ඇතන්ස් හිදී ස්තොයික හා එපිකූරීය පණ්ඩිතයන් සමග වාද කර ඔවුන්ගේ විශ්වාසය ඉදිරිපත් කිරීමට හැකි වීම
- කුඩාරම් සෑදීමේ කර්මාන්තය දැන සිටීම - අකිලා සහ ප්‍රිස්කිලා සමග නවාතැන් ගැනීම අවස්ථාව ලැබීම
- ග්‍රීක භාෂාව දැන සිටීම. විජාතිකයන් වෙත යැමට පහසු වීම


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(iii) පාවුල්තුමාගේ ජීවිතය හා සේවය මගින් අද කිතුනු අප අනුගත කළ යුතු වටිනා ලක්ෂණ කවරේදැයි විස්තර කරන්න.

- ජීවිතයේ පූර්ණ හැරීමක් සිදුවූ පාවුල් ක්‍රියා කලාපයකට යෙදුනා සේ කිතුනුවන් ද දේව රාජයේ වටිනාකම් මත ජීවිතයට පදනමක් දැමීම
- නිර්භීතව යුක්තිය උදෙසා නැගී සිටීම - පාවුල් පිලිපියේ සිරගෙදරදී ක්‍රියාකලා මෙන්
- දෙවියන් වහන්සේට අපේ සෑම සාර්ථක ක්‍රියාවක දීම ගෞරවය හිමි කිරීම
  උදා :- පාවුල් ලුස්ත්‍රාවේ දී ක්‍රියා කලාක් මෙන්
- බහු ආගමික පරිසරයක අන් අය හෙලා දකිනවා වෙනුවට අවස්ථානෝචිත ප්‍රඥාවෙන් ක්‍රියා කර ක්‍රිස්තුස් වහන්සේ හඳුන්වා දීමට අදාළ කර ගැනීම. උදා- ඇතන්ස් හිදී පාවුල්
- පිළිම වැදුම් පිදුම්, යක්ෂ - ගුරුකම් ආදි වැරදි මත වල ආදීනය පෙන්වා දීම
  උදා :- එපිසය, කිතුනුවන් ද එවැනි වැරදි ක්‍රියාවලින් ඈත් විම
- අන්‍යයන්ට විවෘතව ක්‍රියා කිරීම, යාච්ඤාවට වැදගත් තැනක් දීම

**(2+3+5 = ලකුණු 10)**

**5.** "ගැලවීම අද මේ ගෙදරට පැමිණ ඇත. ........... මනුෂ්‍ය පුත්‍රයාණෝ නැතිවූ දේ සොයන්නටත් ගලවන්නටත් වැඩම කළ සේක."

(i) ජේසුස් වහන්සේ මෙසේ පැවසුවේ කාගේ නිවසේදී ද? පසුබිම වූයේ කුමන අවස්ථාවක් ද?

ජේසුස් වහන්සේ මෙම වදන් පැවසුයේ සාකෙවුස්ගේ නිවසේ දීය. ඔහු ජේසුස් වහන්සේ දැකීමට උත්සහ කිරීමට ඔහුගේ නිවසට වැඩම කළ අවස්ථාවේ දී පසුතැවීම සිදුවූ නිසාය

(ii) නැතිවූවන් සෙවීමට හා ගළවා ගැනීමට ජේසුස් වහන්සේ ක්‍රියා කළ අවස්ථා **තුනක්** ඉදිරිපත් කරන්න.

- නොගමගිය සාකෙවුස්ගේ යහමගට ගෙන වීම
- පව්කාර ස්ත්‍රීයට සමාව දී නව මගට යොමු කිරීම
- ලාදුරු රෝගීන්ට අත ගසා සුව කර සමාජයට ගැනීම
- අත පණ නැති මිනිසා සබත් දිනයේ දී සුවකර දීම
- ලෙවී තම ගෝල කමට තෝරා ගැනිම

(iii) ඔබේ නොමග ගිය මිත්‍රයකු යහමගට ගෙන ඒමට ජේසුස් වහන්සේගේ සේවයේ මාර්ග පදනම් කරගෙන ඔබට ගත හැකි ක්‍රියාමාර්ග **පහක්** විස්තර කරන්න.

- මත්ද්‍රව්‍ය හෝ මත්පැන් වලට ඇබ්බැහි වූවෙක් නම් ඔහු ඇසුරු කර එහි ආදීනව දක්වා අලුත් මගකට සිත යොමු කර වීම. එබඳු මිත්‍රයෙකු සඳහා යාච්ඤා කිරීම
- සමාජයේ පන්ති කොන්වී ඇති ශිෂ්‍යයෙකු පිළිගැනීම.
- තම හැකියා මගින් අනුනට උදවු කිරීම
- පාපයට ලක්වී ඇති අයෙකු එයින් මුදවා ජීවිතය ගොඩනැගීමට උත්සහ කිරීම

**(2+3+5 = ලකුණු 10)**


Download all Past Papers> https://bookbeekid.com/resource/past-paper

**6.** "අප ජීවත් වන ලොවෙහි අසාධාරණය රජ කරයි."

(i) "යුක්තිය ගලා බසින දිය දහරක් මෙන් ද ධර්මිෂ්ටකම නොසිඳී ගලන ගඟක් මෙන් ද පැවතිය යුතු ය." මෙසේ පැවසූ දිවැසිවරයා නම් කර, ඔහු අපේක්ෂා කළ සමාජ පරිවර්තනය කෙබඳු වී දැයි ඉදිරිපත් කරන්න.

මෙම ප්‍රකාශය කළේ ආමොස් දිවැසිවරයාය
ධර්මිශ්ඨකම හා යුක්තිය ක්‍රියාත්මක කෙරෙන සමාජ අපේක්‍ෂා වෙන් ඔහු අයුක්තිය ආසාධාරණය
දුටුවේ උතුරු දේශයේ දීය

(ii) ජේසුස් වහන්සේ මෙලොවට වැඩම කළ සමාජය තුළ යුක්තිය පසිඳාලීමට මැදිහත් වූයේ කෙසේ දැයි උදාහරණ **තුනක්** මඟින් පහදන්න.

රෝගීන්ව සමාජයේ ඈත් කර සිටින අවස්ථාවේ ඔවුන්ට කරුණාව දක්වා පිළිගැනීම
කාන්තාවන් කොන් වී සිටි අවස්ථාවේ ඔවුන්ට දේව රාජ්‍යයේ වැඩට පිවිසීමට අභියෝග කිරිම
කාන්තාවන් ශ්‍රාවකයන් ලෙස පත් කිරීමෙන් අවස්ථාවක් ලබා දීම
දරුවන්ට සමාජයේ නිසි තැන ලබා දීමට දේව රාජ්‍යයේ ශ්‍රේෂ්ඨතම වන්නේ දරුවන් බව පැවසීම

(iii) ඔබ ජීවත් වන සමාජයේ දක්නට ඇති විවිධ අසාධාරණකම් තේරුම් ගනිමින් යුක්තිය හා සාධාරණත්වය ස්ථාපිත කිරීමට ක්‍රියා කළ යුත්තේ කෙසේ දැයි යෝජනා **පහක්** ලියා දක්වන්න.

කාර්මාන්ත ශාලා හා වතුකරයේ කම්කරුවන් වෙනුවෙන් කිතුනු සංවිධාන මඟින් ඔවුන් වෙනුවෙන් හඬක් නැගීම
දේශපාලන අසාධාරණත්වය
රැකියාවලට පත් කිරීමේ දී යුක්තිය ඉටු කිරීමට යොමු වීම
සූරා කෑමට ලක් වන දුප්පත් ජනතාවගේ පහසුකම් සලසා දීම
මාධ්‍යය යොදා ගැනීම
ගෘහස්ත ප්‍රචණ්ඩත්වය හා අසාධාරණය ගැන දැනුවත් කිරීමේ ව්‍යාපෘති දියත් කිරීම
සුළු ජාතීන් හා මහ ජාතීන් අතර භේද අවම කිරීමට ක්‍රියා කිරීම

**(2+3+5 = ලකුණු 10)**

**7.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් **දෙකක්** තෝරා ගෙන බයිබලයෙන් උදාහරණ සහිත ව පුහුණු සටහන් ලියන්න.

(i) ආගන්තුක සත්කාරය

**ආගන්තුක සත්කාරය**

යුදෙව් සමාජයේ මෙය විශේෂ ලක්ෂණයක් විය උදා :- අබ්‍රහම්, මාර්තා සහ මරියාගේ නිවසේ පැවැති ආගන්තුක සත්කාරය. පාවුල් සිරකරුවෙකු ලෙස මෝල්ටාවේ දී ලැබූ ආගන්තුක සත්කාරය.
කිතුනු අප ගෙන් බලාපොරොත්තු වන්නේ අප නොදන්නා වූ දුගී අය සඳහා වැඩි සැලකිල්ල දැක්වීමය.
උත්සව සඳහා එබඳු අයට ආරාධනා කිරීම, සත්කාර කිරීම. තමාට ආරාධනා ලැබූ විට පසු ආසන ගැනීම.


Download all Past Papers>> https://bookbeekid.com/resources/past-pape

(ii) බහුවිධ සමාජයේ සමගියට කැපවෙමු.

**බහුවිධ සමාජයේ සමගියට කැපවෙමු**

ලාංකික අප වෙසෙන්නේ බහුවිධ සමාජයකය . විවිධ ජාතීන් බහු අගමිකයන් අතර ජීවත් වන්නේමු. ඔවුන් හා කිතුනු අප අතර සමගිය විස්ථාපනය කිරීමට ක්‍රියා කළ යුතුය. විවිධ ජාතීන්ගේ උත්සව සැමරීමේ දී පාසලේ දී හෝ තම නිවසේ දී ඒවාට නොපිරිහෙලා සහාය දිය යුතු අතර, කිතුනු අනන්‍යතාවය රැක ගත යුතුය. බහු ආගමිකයන් හෙලා දැකීම වෙනුවට සමගියෙන් ක්‍රියා කළ යුතුය.

උදා :- පාවුල් තුමා ඇතන්ස් හිදී පිළිම වන්දනාව, විවිධ විශ්වාස හෙලා දැකීමට වෙනුවට ගත් ක්‍රියාමාර්ග, ඔවුන්ගේ සාහිත්‍යයෙන් සුභ ආරංචි මෙහෙවරයේ යෙදීම

ජෙරුසලමේ මන්ත්‍රණ සභාවේ ජාති භේද අභිබවා තීරණ ගැනීම වැදගත්ය. ශුද්ධාත්ම මග පෙන්වීමේ පේදුරුතුමා අන්‍යජාතික කොර්නේලිස්ගේ නිවසට යාම. ජේසුස් වහන්සේ රෝම ශාතාධිපතියාගේ ඇදහිල්ල ප්‍රශංසා කිරීම. සමාරිය මැදින් ගමන් කිරීම. සමාරිත ස්ත්‍රිය හා සංවාදයේ යෙදීමෙන් අන්‍යය ජාතීන් පිළිගැනීමෙන් පෙනි යයි.

(iii) පාවුල්තුමා විසින් ප්‍රේමය පිළිබඳ ඉදිරිපත් කර ඇති ඉගැන්වීම්

පාවුල් තුමා කොරින්ති වාසින්ට යැවූ ලිපියේ 13 වෙනි පරිච්ඡේදය ප්‍රේමයේ විශේෂ ගුණාංග ඉදිරිපත් කර ඇත. ප්‍රේමය ඉවසිලිවන්තය , කරුණාවන්තය , ඊර්ෂ්‍යාවන්නේ නැත, උඩඟු වන්නේ නැත, අවිනීත නොවේ, ආර්මාර්ථකාමී නොවේ, හනික කිපෙන්නේ නැත, නපුරු සිතේ ධාරණය කර නොගනී, අනුන්ගේ වරද ගැන ප්‍රිති නොවේ, හරිදේ ගැන ප්‍රීති වේ, සියල්ල උසුලයි, විශ්වාසයට ඉමක් නැත, බලාපොරොත්තුවය නිමක් නැත, ඉවසීමට අගක් නැත. මෙබදු ලක්ෂණ සිත් හි නැති විට උඩගුකම , ඊර්ෂ්‍යාව කෝපය වෛරය වැනි සමාජයට අහිතකර ක්‍රියා ඉස්මතු වේ. ඒවායින් කිතුනුවන් වැලකී සිටීම වැදගත් ය.

(iv) දුක්විඳීම පිළිබඳ ජේසුස් වහන්සේ ස්ථාපනය කළ නව ආකල්පය

**දුක් විඳිම පිළිබද ජේසුස් වහන්සේගේ නව ආකල්ප**

දුක් විඳිම පව්කරුවන්ට පමණක් නොව සියලු මනුෂ්‍යයින්ට පොදු බව. යම් අවස්ථාවකදි ජීවිතයේ පුද්ගලයෙකුට මුහුණු පැමට සිදුවේ. ජේසුස් වහන්සේ අනුව දුක් විඳිම ප්‍රීතියෙන් පිළිගත යුතුවේ. එය නව ජීවිතයටකට පිවිසීමට මගක් බව හෙලිකළ සේක. ජේසුස් වහන්සේ සිය ජීවිතයෙන් දුක් විඳීමෙන් ජය ලැබූ සේක. උන්වහන්සේ දුක් උසුලන සේවකයාණෝ බව දිවැසි වැකි ප්‍රකාශ කළ සේක. කුරුසිය ගෙන යන කවරෙකුට වුවද නව බලා පොරොත්තුවක් හා ජීවනයක් ඇති බව ඉදිරිපත් කර ඇත.

උදා :- ජෝබ් සහ ජෙරමියා, ජේසුස් වහන්සේ දුක් විඳීමෙන් තම ජිවිත පූජාවට පවා නිර්භිතව ඉදිරිපත් වූ සේක/පාවුල් සිය හැරීමෙන් පසු දුක් විඳිම ප්‍රීතියෙන් පිළිගත්තේය.

**(5+5 = ලකුණු 10)**



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/